# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1794/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 03/12/2024 පැය 0550

# මාධ්‍ය නිවේදනය

**01. ගජමුතු 02 ක් සමඟ සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට - ඊච්චලම්පත්තුව පොලිස් වසම.**

2024.12.02 වන දින දහවල් කාලයේ ඊච්චලම්පත්තුව පොලිස් වසමේ පූනගර් ප්‍රදේශයේදී ඊච්චලම්පත්තුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විකිණීම සඳහා ගජමුතු 02 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 35, 37, 42 හා 69 වයස්වල පසුවන කඩවත, අරලගංවිල, ගම්පහ සහ ගෝනගේන යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ඊච්චලම්පත්තුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. බඳින තුවක්කුවක් පත්තුවීමෙන් පුද්ගලයෙකු තුවාල ලැබීම - පොල්පිතිගම පොලිස් වසම.**

2024.12.01 වන දින සවස් කාලයේ පොල්පිතිගම පොලිස් වසමේ අමුණකොළේ ප්‍රදේශයේදී බඳින තුවක්කුවක් පත්තුවීමෙන් තුවාල ලැබූ පුද්ගලයෙකු කුරුණෑගල රෝහලට ඇතුළත් කර ඇති බවට පොල්පිතිගම පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 21 ක් වූ අමුණකොළේ, මොරගොල්ලාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාලකරු ළඟු කැලෑ ප්‍රදේශයකට ගොස් සිටි අවස්ථාවක මෙලෙස බඳින තුවක්කුවක් පත්තු වී ඇති බවට විමර්ශනවලදී අනාවරණය වී ඇත. මෙම තුවක්කුව බඳින ලද සැකකරු සම්බන්ධව මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැති අතර පොල්පිතිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. ලිඳකට වැටී පුද්ගලයෙකු මියයාම - මුලතිව් පොලිස් වසම.**

2024.12.02 වන දින උදෑසන කාලයේ මුලතිව් පොලිස් වසමේ මුල්ලවයික්කාල් ප්‍රදේශයේ ලිඳකට වැටී පුද්ගලයෙකු මියගොස් ඇති බවට මුලතිව් පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 32ක් වන මුල්ලවයික්කාල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සිය මව සමඟ නිවසේ පදිංචිව සිට ඇති අතර මව නිවසින් බැහැරව ගොස් නැවත නිවසට පැමිණි අවස්ථාවේ මරණකරු නිවස ආසන්නයේ තිබූ අඩි 15 ක් පමණ ගැඹුරු ළිඳට වැටී සිටිනු දැක ඇති අතර ඔහු ළිඳට වැටුනු ආකාරයක් සම්බන්ධව මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැත.

මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණයෙන් හා පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාරදී ඇත. මුලතිව් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියයාම - නෙළුව පොලිස් වසම.**

2024.12.02 වන දින උදෑසන කාලයේ නෙළුව පොලිස් වසමේ බරනිවල, පන්නිමුල්ල ප්‍රදේශයේදී අලියෙකු පහරදීම හේතුවෙන් පුද්ගලයෙකු බරපතල තුවාල ලබා නෙළුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට ලද තොරතුරක් මත නෙළුව පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වූ දැලිගම, කිතුල්ගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු මෙම අලියා රැකබලා ගත් ඇත්ගොව්වා වන අතර දැව කඳන් ඇදීමට එම අලියා බරනිවල ප්‍රදේශයට ටිපර් රථයකින් රැගෙන ගොස් ඇත. එම කාර්යය අවසන් කර නැවත ලොරි රථයකින් අලියා රැගෙන පැමිණෙමින් සිටියදී එම ලොරි රථය මාර්ගයේ එරීමකට ලක්ව ඇති අතර අලියා ලවා ලොරි රථය ඇදීමට උත්සාහ කිරීමේදී කුපිත වී ඇත්ගොව්වාට පහරදී ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

අලියා නිර්වින්දනය කර ආරක්ෂිතව එම ස්ථානයෙන් ඉවත් කිරීමට උඩවලව ඇත් තුරු සෙවණ පශු වෛද්‍යවරුන් විසින් කටයුතු කර ඇත. නෙළුව පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අනුරාධපුර පොලිස් ස්ථානය.**

2024.12.02 වන දින දහවල් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ නව නගරය ප්‍රදේශයේදී අනුරාධපුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 510 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන මහවිලච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.12.02 වන දින රාත්‍රී කාලයේ මොරටුව පොලිස් වසමේ රාවතාවත්ත ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 150 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන මොරටුව පොලිස් ස්ථානයට ඉදිරිපත් ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 55 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුර.

2024.12.02 වන දින සවස් කාලයේදී මැදවච්චිය පොලිස් වසමේ වහමල්ගොල්ලෑව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **ගංජා කිලෝග්‍රෑම් 02 ග්‍රෑම් 50ක් සන්තකයේ තබාගෙන කාර් රථයකින් ගමන් කරමින් සිටි** සැකකරුවෙකු කාර් රථයද සමග අත්අඩංගුවට ගෙන මැදවච්චිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන වහමල්ගොල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. විදේශ රටක නිෂ්පාදිත රිවෝල්වර් අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.

2024.12.02 වන දින රාත්‍රී කාලයේ පානදුර දකුණ පොලිස් වසමේ මෝදරවිල ප්‍රදේශයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශ රටක නිෂ්පාදිත රිවෝල්වර් අවියක් හා එම පතරොම් 05ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කඳපොල පොලිස් ස්ථානය.

2024.12.02 වන දින දහවල් කාලයේ රාගල පොලිස් වසමේ රාගල ප්‍රදේශයේදී කඳපොල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන රාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඳපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.**

2024.12.02 වන දින උදෑසන කාලයේදී ගම්පහ පොලිස් වසමේ කොස්ඹිවිට ප්‍රදේශයේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1080ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන ගණේමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. නීතිවිරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය.**

2024.12.02 වන දින සවස් කාලයේදී පමුණුගම පොලිස් වසමේ උස්වැටකෙයියාව ප්‍රදේශයේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පන් ලීටර් 67 ක් (බෝතල් 90) සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. වීසා නොමැතිව මෙරට රැඳී සිටි විදේශිකයන් 08 දෙනෙකු අත්අඩංගුවට - නුවරඑළිය පොලිස් ස්ථානය.**

2024.12.02 වන දින සවස් කාලයේ නුවරඑළිය පොලිස් වසමේ හාවාඑළිය ප්‍රදේශයේදී නුවරඑළිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර ආගමන විගමන කොන්දේසි උල්ලංඝණය කරමින් වීසා නොමැතිව රැඳි සිටි විදේශිකයන් 08 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28 ත් 65 ත් අතර වයස් වල පසු වන ඉන්දුනීසියන් ජාතිකයන් වේ.**

නුවරඑළිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මාරක රිය අනතුරක් - කහතුඩුව පොලිස් වසම.**

2024.12.02 වන දින උදෑසන කාලයේ කහතුඩුව පොලිස් වසමේ කොට්ටාව තලගල මාර්ගයේ කුරුඳුවත්ත පාරට හැරෙන හන්දියේදී දියගම දෙස සිට කොට්ටාව දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන් කල පදිකයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා හෝමාගම රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 74 ක් වූ හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, අනතුරට සම්බන්ධ කාර් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කහතුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. මාරක රිය අනතුරක් - හංවැල්ල පොලිස් වසම.**

2024.12.02 වන දින දහවල් කාලයේ හංවැල්ල පොලිස් වසමේ අවිස්සාවේල්ල කොළඹ පැරණි මාර්ගයේ හංවැල්ල නගරය ආසන්නයේදී අවිස්සාවේල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් එම දිශාවටම ධාවනය වූ වෙනත් වාහනයකට ඉස්සර කිරීමට යාමේදී රියදුරුට බස් රථය පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මාර්ගය අයිනේ නවතා තිබූ ත්‍රීරෝද රථයක හා මාර්ගයේ ගමන් කරමින් සිටි කාන්තාවකගේද, අනතුරුව විදුලි රැහැන් කණුවකද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව ශාලාව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 75 ක් වූ වැලිකන්න ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය ශාලාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස්රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**15. මාරක රිය අනතුරක් - කිරින්ද පොලිස් වසම.**

2024.12.02 වන දින දහවල් කාලයේ කිරින්ද පොලිස් වසමේ තිස්සමහාරාමය කිරින්ද ප්‍රධාන මාර්ගයේ සුදුවැලිපැලැස්ස සාම මාවත හන්දියේදී තිස්සමහාරාමය දෙස සිට කිරින්ද දෙසට ධාවනය වූ සෆාරි ජීප් රථයක් එම දිශාවටම ධාවනය වූ යතුරු පැදියකට ඉස්සර කිරීමට යාමේදී එම යතුරු පැදියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු සහ පසුපැදිකාරිය කිරින්ද රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පසුපැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 46 ක් වූ කිරින්ද ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කිරින්ද රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ජීප් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කිරින්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**16. මාරක රිය අනතුරක් - මාතර පොලිස් වසම.**

2024.12.02 වන දින දහවල් කාලයේ මාතර පොලිස් වසමේ මාතර හක්මණ මාර්ගයේ දුම්රියපොල පාරට හැරෙන හන්දියේදී මාතර දෙස සිට හක්මණ දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන් කල පදිකයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා මාතර රෝහලට ඇතුළත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කරාපිටිය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 76 ක් වූ දෙවිනුවර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**17. මාරක රිය අනතුරක් - පල්ලම පොලිස් වසම.**

2024.12.02 වන දින සවස් කාලයේ පල්ලම පොලිස් වසමේ ආණමඩුව බංගදෙනිය මාර්ගයේ වෙන්දකඩුව පල්ලිය ඉදිරිපිටදී ආණමඩුව දෙස සිට බංගදෙනිය දෙසට ධාවනය වූ යතුරු පැදියක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි කැබ්

රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකාරිය හා පසු පැදිකරු හලාවත රෝහලට ඇතුළත් කිරීමෙන් පසු පැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 30 ක් වූ මාදම්පේ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කැබ් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, පල්ලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**